සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019(II)

| කාලය: පැය 03 | පරිපාලනය (02-II) | විභාග අංකය Index No / சுட்டெண் ........................ |
|---|---|---|

- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
- සියළුම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

---

1. i. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටි රීති V වන පරිච්ඡේදයේ දැක්වෙන පරිදි රාජ්‍ය සේවයට පත්කිරීමට නුසුදුසු තැනැත්තන් පස්දෙනකු නම් කරන්න (ලකුණු 10)

   ii. රජයේ නිලධාරියෙකු රජයේ සේවයෙන් තාවකාලිකව මුදාහරින ලෙස කරනු ලබන ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා මොනවාද? (ලකුණු 10)

2. i. රජයේ සේවයෙන් විශ්‍රාම ගිය පසු නැවත සේවයේ යෙදවීමට සුදුසුකම් නොලබන තැනැත්තන් කවරහුද? (ලකුණු 05)

   ii. රාජ්‍ය සේවකයන් විසින් සිදු කරනු ලබන බරපතළ වැරදි පහක් (05) ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ I වන උපලේඛනයේ සඳහන් ආකාරයට නම් කරන්න. (ලකුණු 15)

3. i. ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධාරීන් නම් කරන්න. (ලකුණු 06)

   ii. විනය නියෝගයක අනිවාර්යෙන්ම ඇතුලත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 14)

4. i. සංයුක්ත දීමනා ගෙවීමේදී සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සඳහන් කරන්න. (ලකුණු 10)

   ii. උපවේශන දීමනා ලබාදීමේදී සලකා බැලෙන කරුණු මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 10)



45

5. i. ආයතන සංග්‍රහයේ දක්වා ඇති පරිදි රාජ්‍ය සේවකයන් සඳහා පරිවාස කාලයෙහි වැදගත්කම කෙටියෙන් දක්වන්න. (ලකුණු 14)

ii. පරිවාස කාලය තුල දී රජයේ නිලධාරීන් පිළිබඳව ඉදිරිපත් කළ යුතු වාර්ෂික සමාලෝචන වාර්තාවෙන් ඇගැයීමක් කරනු ලබන මූලික කරුණු තුනක් (03) දක්වන්න. (ලකුණු 06)

6. i. කිසියම් රජයේ නිලධාරියකු තම වැටුප් වර්ධකය උපයා ගැනිමට අවශ්‍ය කරුණු සපුරා නොමැති නම් එම වැටුප් වර්ධකය ප්‍රතික්ෂේප කළ හැකි ආකාර හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 08)

ii. එයින් ආකාර දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 12)

7. i. සාමාන්‍ය හැසිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදය දක්වා ඇති විධි විධිවිධාන සඳහන් කරන්න. (ලකුණු 10)

ii. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදය ප්‍රකාර දෙවන උපලේඛනයේ සඳහන් චෝදනාවකට වරදකරුවකු වන නිලධාරියෙකුට පැනවිය හැකි දඬුවම් කවරේද? (ලකුණු 10)

8. i. රජයේ නිලධාරියෙකුට ඉකුත් නිවාඩු ලබා ගත හැකි අවස්ථා මොනවාද? (ලකුණු 10)

ii. අනියම රජයේ සේවකයෙකුගේ නිවාඩු සම්බන්ධ කොන්දේසි මොනවාද? (ලකුණු 10)

*************



46